12 ( 1 )


ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.    ඔබේ අංකය / உமது இல. / Your No .    දිනය / திகதி / Date. 2023 - 04 - 04

| | | | |
|---|---|---|---|
| වින්දිත පාර්ශවය | : | 01. | එම්.ජී. ගුණරත්න මහතා,<br>කොටුව වත්ත, පන්සල පාර,<br>වැහැර. |
| වගඋත්තරකාර ආයතන | : | 01. | නාගරික කොමසාරිස්,<br>මහ නගර සභා කාර්යාලය,<br>කුරුණෑගල. |
| | | 02. | සභාපති,<br>නාගරික සංවර්ධන අධිකාරිය,<br>6 වන සහ 7 වන මහල,<br>සෙත්සිරිපාය, බත්තරමුල්ල. |
| | | 03. | කොමසාරිස්,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>කුරුණෑගල. |
| | | 04. | මූලස්ථාන පොලිස් පරීක්ෂක,<br>මූලස්ථානය පොලිස් ස්ථානය,<br>කුරුණෑගල. |

**පැමිණිලි අංකය : HRC/ME/SUO-MOTU/05/2022**

"2022.09.05 වන දින පැවති අධික වර්ෂාව මධ්‍යයේ පාසල නිමවී නිවස බලා යමින් සිටි කුරුණෑගල වැහැර ප්‍රදේශයේ වයස අවුරුදු 14 ක් වූ සජිත ගුණරත්න නම් පාසල් ශිෂ්‍යයා අනාරක්ෂිත බෝක්කුවකට වැටී මිය යාමේ" සිද්ධිය සම්බන්ධයෙන් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය පළකරන ලද පුවත්පත් වාර්තා අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව හිමිවී ඇති බලතල ප්‍රකාරව




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ස්වයං මෙහෙයවීමෙන් විමර්ශනයක් සිදුකර ඇත. මෙහිදී මෙම සිද්ධිය සම්බන්ධයෙන් ඊට වගකිවයුතු ආයතනවල ක්‍රියාපටිපාටිය හා එම ආයතනයන් නියාමනය කිරිමට වගකීම් පැවරී ඇති රාජ්‍ය ආයතනවල ක්‍රියාත්මක වීම කුමන ආකාරයෙන් සිදුවූයේද යන්නත් කොමිෂන් සභාවේ අවධානය යොමු කර ඇත.

**ඒ අනුව පහත කරුණු කොමිෂන් සභාවේ අවධානයට ලක්ව ඇත.**

01. ඉහත කී 2022.09.05 දින දවස පුරාම වර්ෂාපතනය පැවත ඇති අතර, මිලි මීටර් 100 කට වැඩි වර්ෂාපතනයක් කුරුණෑගල නගර සීමාව තුළට එදින පතිත වී ඇත. එහිදී මෙම දරුවා අදාළ ජලය පිරී ඇති කාණුවකට වැටී ඇති අතර, එම අවස්ථාවේදී දරුවා ඇල මාර්ගයේ කොන්ක්‍රීට් දමා වසා තිබූ කොටසක හිරවී ඇති බවත්, ගලවා ගැනීමේ කණ්ඩායම් දරුවා සොයාගැනීමෙන් අනතුරුව රෝහල්ගතකළද ඒ වන විටත් දරුවා මරණයට පත්ව ඇති බවත් වාර්තා වී තිබුණි.

02. පොලිස් ස්ථානය විසින් අධිකරණය වෙත කරුණු වාර්තා කළ "බී" වාර්තාවේ දක්වා ඇති පරිදි සිදුවීම ඇසින් දුටු සාක්ෂිකරුවෙකු දක්වන්නේ, වර්ෂාවට මාර්ගය යටවීම නිසා සිද්ධිය සිදුවූ ස්ථානයට මීටර 10-15 ක් පමණ දුරින් තම යතුරුපැදිය නතර වූ බවත්, බණ්ඩාරනායක විදුහල දෙස සිට තමන් සිටි දෙසට වෑන් රථයක් පැමිණි බවත්, මීගහකුඹුරට හැරෙන පැත්තෙන් කලුපාට කුඩයක් ඉහලාගත් පාසල් සිසුවකු ගමන් කරනු දුටු බවත්ය. එම වර්ෂාව සහිත අවස්ථාවේ මාර්ගය අඩි 2 2 ½ ක් පමණ ජලයෙන් යටවී තිබී ඇති අතර, ළමයාගේ කකුල ලිස්සා ගොස් මාර්ගයේ තිබූ බෝක්කුවක ආරක්ෂිත වැටක් නොතිබුණු ස්ථානයකින් කාණුවට වැටී මාර්ගය හරහා ගසාගෙන ගිය බවත්ය.

03. මෙම පැමිණිල්ලට අදාළව වගඋත්තර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති පොලිස් උධෘත පරීක්ෂා කිරීමේ දී පෙනීයන්නේ, ප්‍රදේශවාසීන් විසින්, අනවසර ඉදිකිරීමක් පිළිබඳව ද, විශාල ප්‍රදේශයකින් ගලා එන ජලය බැසයාමට තිබෙන කාණුවේ ප්‍රමාණය පිළිබඳව ද, නගර සභාව ඇතුළු අදාළ පාර්ශවයන් බොහෝ අවස්ථාවල දැනුවත් කර ඇති බවයි.

04. කොමිෂන් සභාව විසින් 2022.09.07 වන දින ස්ථානීය පරීක්ෂාව සිදුකර ඇති අතර, එහිදී අනාවරණය වී ඇත්තේ අදාළ බෝක්කුව හා මාර්ගය අලුතින් කාපට් යොදා සකස් කළද බෝක්කුවේ ආරක්ෂිත පැති වැටවල් සකස් කොට නොමැති බවයි. තවද අදාළ බෝක්කුවෙන් ගලා යනු ලබන ජල කාණුවේ උඩ කොටස ස්ථිර කොන්ක්‍රීට් යොදා වසා දමා ඇති අතර, දරුවා බේරාගැනීමේ දී බැකෝ යන්ත්‍ර යොදා ඒවා කඩා ඇමීමට ද සිදුව ඇත. කුරුණෑගල පොලීසිය වාර්තා කර ඇති කරුණු අනුව විශාල පරිශ්‍රමයක් දරා දරුවා බේරාගෙන රෝහල් ගත කළද දරුවා මිය ගොස් ඇති බවද දක්වා ඇත.

05. එසේම අලුතින් කාණුව අසල තාප්පයක් ද නිරීක්ෂණය වී ඇති අතර, කාණුවේ සමහර ස්ථාන එහි අසල පදිංචි පුද්ගලයින් තමන්ගේ පෞද්ගලික ඉඩම් තුළට ඇතුළත් කර වැටවල් ගසා සමහර ස්ථාන වලින් කාණුව උඩ ස්ථිර කොන්ක්‍රීට් දමා ගේට්ටුද දමා ඇති බවට නිරීක්ෂණය වී ඇත.

06. කෙසේ වෙතත් 2022.09.13 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයේදී කුරුණෑගල නගර සභාවේ නාගරික කොමසාරිස් නියෝජනය කරමින් පැමිණි වැඩ අධිකාරීවරයා විසින් කරුණු දක්වමින් අදාළ මාර්ගය කුරුණෑගල මහ නගර සභාවට අයත් බවට දක්වා ඇත. එසේම අදාළ පැති බැම්ම ඉදිනොකිරීම නිසා එය අනාරක්ෂිත බව දක්වමින් මහජනයා දැනුවත් කිරීමට කටයුතු නොකළ බවත් ඔහු විසින් පිළිගෙන ඇත.

07. එහිදී සුරවීර නම් පුද්ගලයෙකු විසින් ඉදිකළ කාණුවක් අනවසර ඉදි කිරීමක් බවත් එයට නඩු පවරා නැති බවත්, ඔහු විසින් දක්වන ලද අතර, පොලිස් උධෘත පරීක්ෂා කිරීමේදී පෙනීයන්නේ අදාළ තාප්පය ඉදිකිරීමට නගර සභාවෙන් සෙත්සෙවන පෞද්ගලික රෝහලට අනුමැතිය ලබා ඇති අතර, අදාළ ඉඩම මැදින් ජලය ගලාගිය කාණුවක් තිබූ බවයි.

08. කෙසේ වෙතත් අනෙකුත් අනවසර ඉදිකිරීම් පිළිබඳව පැමිණිලි තිබේද යන්න ඉදිරිපත් කිරීමට වගඋත්තරකරු අසමත් වූ බව නිරීක්ෂණය වේ.

**නිරීක්ෂණ :-**

අදාළ බෝක්කුව සහිත පාර හා කාණුව කුරුණෑගල නගර සභාවට අයත් වන අතර, මෙහිදී නගර සභාව වරිපනම් බදු අයකිරීම තුළින් මහජනතාව සමග එළඹෙන ගිවිසුම ප්‍රකාරව ජනතාවට යහපත් සෞඛ්‍ය සම්පන්න ආරක්ෂිත පරිසරයක් මහ නගර සභා ප්‍රදේශයට තුළ සලසා දිය යුතුව පවතී.

තවද අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම මෙන්ම අනාරක්ෂිත ස්ථාන පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වගකීමද මහනගර සභාව සතු වේ. අධික නාගරීකරණයත් සමඟ ජලය බැසයාමේ ඇළ, කාණු ආදිය අවහිරයකින් තොරව පවත්වාගෙන යාම මෙන්ම ඒවා කලින් කලට පිරිසිදු කිරීමටත් ප්‍රමාණවත් නොවේ නම් ඒවා වැඩි දියුණු කිරීමටත් 1947 අංක 16 දරන මහනගර සභා ආඥා පනතේ 97 හා 98 වගන්ති ප්‍රකාරව බලතල පවතී.

වර්ෂාවකදී මාර්ග ජලයෙන් යට වනුයේ ජලය බැසයාම නිසියාකාරව සිදු නොවන බැවිනි. මෙම සිදු වීමේදී කාණුවේ ප්‍රමාණය කුඩා වීම්, අනවසර ඉදිකිරීම්, කාණුව දීර්ඝ කාලයකින් පිරිසිදු කර නඩත්තු කර නොතිබීම ආදිය වැනි ජලය නිසි පරිදි ගලා නොයෑමට හේතු වී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව මහනගර සභාවට අදාළ වගකීමෙන් මිදිය නොහැකි අතර, මහජනතාවගේ ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳව දැඩි වගකීමක් පවතින බව බැහැර කළ නොහැක.

ආපදාව සිදුවූ ප්‍රදේශය කුඹුරු ඉඩම් ගොඩකර තිබූ බව නිරීක්ෂණය වී ඇති අතර, අදාළ මාර්ගය අවහිර වී තිබුණු තත්වයක් නිරීක්ෂණය වී ඇත. එම කුඹුරු ඉඩම් ගොඩකිරීම නිසි ක්‍රමවේදයක් අනුගමනය කරමින් අවසර ලබාදුන් බවක් පරීක්ෂණයේ දී අනාවරණය වී නොමැත.

කුරුණෑගල මහ නගර සභා සීමාව සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද නාගරික සැලැස්ම පරීක්ෂණයේදී ඉදිරිපත් කිරීමක් අදාළ නිලධාරීන් විසින් සිදු කර නොමැත.

කුරුණෑගල මහ නගර සභා සීමාව තුළ සිදුවූ මෙම ආපදා තත්වය තුළ මුදා ගැනීමේ කටයුතු වල ප්‍රමාදයක් සිදුවූ බවක් මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරනු ලැබේ. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ අංශය සහ කුරුණෑගල මහ නගර සභාව, කුරුණෑගල මූලස්ථාන පොලීසිය අතර නිසි සම්බන්ධීකරණ කටයුතු කළ බවක් නිරීක්ෂණය වී නොමැත.

සියලුම මහ නගර සභා නිලධාරීන් රජයේ නිලධාරීන් වනවා මෙන්ම මහජන බදු මුදලින් තම වැටුප් ලබාගන්නා පුද්ගලයින් බැවින් ඔවුන්ගේ වගවීමේ ප්‍රතිශතය ඉතා ඉහළ බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. ඒ අනුව පහත නිර්දේශයන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලැබේ.

01. සියලුම කරුණු නිරීක්ෂණය කිරීමේදී, කුරුණෑගල මහනගර සභාව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව නීතියෙන් තමා වෙත නියම කර ඇති කාර්යයන් මෙන්ම රජයේ මුදලින් වැටුප් ලබන රජයේ නිලධාරීන් ලෙස තම කාර්යයන් වගකීමෙන් යුතුව ඉටු කිරීමට අපොහොසත් වීම අදාළ දරුවාගේ අවාසනාවන්ත මරණයට හේතුව වී ඇති බවයි. තවද කුරුණෑගල මූලස්ථාන පොලිසිය සහ කුරුණෑගල දිස්ත්‍රික් ආපදා කළමණාකරන ඒකකය මෙවන් අවස්ථාවකදි මීට වඩා සම්බන්ධීකරණයකින් කටයුතු කළ යුතුව තිබූ බවද කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

02. ඉහත සියලු කරුණු අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් දක්වා ඇති නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුතුය යන හිමිකම කුරුණෑගල මහනගර සභාව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ නාගරික සංවර්ධන අධිකාරිය යන ආයතන විසින් උල්ලංඝනය කර ඇත. කුරුණෑගල මූලස්ථාන පොලිසිය සහ කුරුණෑගල දිස්ත්‍රික් ආපදා කළමණාකරන ඒකකයන යන ආයතන මෙම ආපදා අවස්ථාවේ ප්‍රමාණවත් මැදිහත් වීමක් සිදු නොකර ඇති බැවින් මෙම ආයතනයන් වෙතින් ද පුරවැසියන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් දක්වා ඇති නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුතුය යන හිමිකම බිඳවැටීමක් සිදුව ඇති බැවින් පහත නිර්දේශයන් උක්ත ආයතනයන් සම්බන්ධයෙන් වෙන් වෙන් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

**නිර්දේශය :-**

**ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය**

01. දරුවාගේ මරණයට නගරයේ අනවසර ඉදිකිරීම් හේතුවී ඇති බව පෙනී යන බැවින් මේ පිළිබඳව ස්වාධීන විමර්ශනයක් මෙම සිද්ධිය වන අවස්ථාව වන විට සේවයේ නිරතව සිටි නාගරික කොමසාරිස්වරයා, නාගරික ඉංජිනේරුවරුන්, නාගරික වැඩ අධිකාරීවරයා සහ නාගරික තාක්ෂණ නිලධාරීන් සම්බන්ධයෙන් පැවැත්වීම කළ යුතුය.

02. විමර්ශනය අනුව උක්ත වගඋත්තරකරුවන් හෝ එහිදී හඳුනාගන්නා වෙනත් වගඋත්තරකාර පාර්ශවයන් වෙත විනය ක්‍රියාමාර්ග ගත යුතුය.

03. වරදකරුවන් වන පාර්ශවය වෙතින් පෞද්ගලිකව වන්දි මුදලක් දරුවාගේ දෙමාපියන් වෙනුවෙන් ලබාදීම කළ යුතුය.

04. කුරුණෑගල මහ නගර සභාව වෙතින් වන්දි මුදලක් දරුවාගේ දෙමාපියන්ට ලබාදීම කළ යුතුය.

**ගොවිජන සංවර්ධන කොමසාරිස්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

01. කුරුණෑගල නගරය ආශ්‍රිතව කුඹුරු ඉඩම් ගොඩකිරීම පසුගිය වසර 10 තුළ සිදුව ඇති ආකාරය විමර්ශනය කිරීම.

02. නීත්‍යානුකූල නොවන ලෙස/ව්‍යාජ තොරතුරු පදනම් කර ගනිමින් ගොඩකිරීම් සිදුකර ඇති හා ඊට අවසර ලබාදුන් එම නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීම.

03. නීත්‍යානුකූල නොවන ලෙස සිදුකර ඇති ගොඩ කිරීම් නැවත කුඹුරු ඉඩම් බවට පරිවර්ථනය කිරීම සඳහා ඉඩම් හිමි පාර්ශවයන් වෙතින් වැය බර දරණ ආකාරයට කටයුතු කිරීම.

04. ඇළ මාර්ග හෝ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ බලතල සීමා තුළ පවතින ස්ථාන වල අනවසර සිදුකර ඇති ඉදිකිරීම් සම්බන්ධව නඩු පැවරීම කළ යුතුය.

නාගරික සංවර්ධන අධිකාරිය

01. කුරුණෑගල නගරයට අදාළ නාගරික සැළැස්ම සෙසු සම්බන්ධ වන පාර්ශව සමඟ බෙදා ගැනීම.
02. නාගරික සැලැස්ම ක්‍රියාකරන ආකාරය පිළිබඳ එම පාර්ශව වලින් යෝජනා ලබාගැනීම.

මූලස්ථාන පොලීසිය - කුරුණෑගල

01. ආපදා කළමනාකරණ සඳහා අදාළ වන්නා වූ ආයතන සමඟ නිරන්තර සාකච්ඡා කිරීම සහ අඩුපාඩු හඳුනාගෙන අදාළ ආයතන දැනුවත් කිරීම.

දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

01. කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පවතින ආපදාවන් පිළිබඳව අධ්‍යයනයක් සිදුකර අපදාවන් සිදුවිය හැකි තත්වයන් හඳුනාගැනීම කළ යුතුය.

02. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සැලැස්මට සම්බන්ධ වන සෙසු ආයතනයන් සමඟ බෙදාගැනීම කළ යුතුය

03. ආපදා කළමනාකරණයේ දී පවතින අඩුපාඩු පිළිබඳ අදාළ අංශ දැනුවත් කිරීම.

04. ආපදාවකදී කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදයක් සකස්කර එය සජීවී ලෙස පවත්වාගෙන යෑම කළ යුතුය.

2023.-06-23......... වන දිනට පෙර මෙකී නිර්දේශයන් ක්‍රියාත්මක කර ඒ පිළිබඳ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබෙන්න සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම පිළිබඳ පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක් කාලයක් තුල කොමිෂන් සභාවට දැනුම්දිය යුතු අතර එදිනට පෙර අදාළ දැනුම්දීම සිදුනොකරන්නේ නම් පසුව ඉදිපත්කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

B/